**Rivihara Pinnaduwa**
*Attorney-at-Law*

2024-02-03

ලියාපදිංචි තැපෑලෙනි.

සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

35, ඩී.ආර්. විජයවර්ධන මාවත,

ලේක්හවුස්

කොළඹ

**එන්තරවාසියයි**

මාගේ සේවාවාදායක නුගේගොඩ, මෙල්ඩර් පෙදෙස, අංක 22/1හි පදිංචි දූදීශ දූමින්ද නාගමුව මහතාගේ උපදෙස් මත ලියා දන්වමි.

මාගේ ඉහත නම් සඳහන් සේවාදායක පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ප්‍රචාරක ලේකම් ලෙසද එම පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයකු ලෙසද, කම්කරු අරගල මධ්‍යස්ථානයේ සංවිධායක ලේකම් ලෙසද කටයුතු කරයි. එසේම 2015 ජනවාරි 8 දින සහ 2019 නොවැම්බර් 16 දින පැවැති ජනාධිපතිවරණ වලදී පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ අපේක්ෂකයා වශයෙන්ද ඔහු ඉදිරිපත් විය. එසේම පෙරටුගාමී සමාජවාදී පක්ෂය වෙනුවෙන් ප්‍රසිද්ධියේ පෙනී සිටින නායකයකු ලෙසද ඔහු කටයුතු කරයි

ඉහත නම් සඳහන් මාගේ සේවාදායක විසින් 2024 ජනවාරි 29 වැනි දින කෑගල්ල දිස්ත්‍රික්කයේ දේවාලේගමදී පවත්වනු ලැබූ ජනහමුවකදී සිදු කරනු ලැබූ කතාවක උපුටා ගත් කොටසක් ලෙස පහත සඳහන් විකෘති කරන ලද ප්‍රකාශය ඔබ ආයතනය විසින් ප්‍රසිද්ධ කොට පළ කරනු ලබන 'දිනමිණ' පුවත්පතේ 2024 ජනවාරි 31 වැනි දින 'දිනමිණ' පුවත්පතේ මුල් පිටුවේ සහ 6වැනි පිටුවේ පළ කරන ලදී.

"සීසන් අවලංගු කළොත් දුම්රියට – ලංගමට ලාභ ලැබිය හැකියි

-දෙකේම ගාස්තු සම කළ යුතුයි

පාසල් දරුවන්ගේ හා රාජ්‍ය සේවකයන්ගේ දුම්රිය හා ලංගම සීසන් අවලංගු කිරීමෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට හා ලංකා ගමනාගමන මණ්ඩලයට ලාභ ලැබිය හැකි යැයි පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ප්‍රචාරක ලේකම් දුමින්ද නාගමුව මහතා පැවසීය.

ජනහමුවක් අමතමින් ඒ මහතා පැවසුවේ දුම්රිය සීසන් ක්‍රමය අහෝසි කර දුම්රිය ප්‍රවේශපත්‍ර ගාස්තුව බස් ගාස්තුවේ ප්‍රමාණයට ගෙන ආ යුතු බවයි. එවිට දුම්රිය දෙපාර්තමේන්තුව ඉක්මනින්ම ලාභ ලබන තැනට ගෙන ආ හැකි බව ද කීවේය. ඒ මහතා මෙසේ ද කීවේය. අද සමහරු කියනවා මේ ඔක්කොම විකුණනවා කියලා. අද දුම්රිය දෙපාර්තමේන්තුව පාඩු ලබනවා. දුම්රිය දෙපාර්තමේන්තුවේ ආදායම බිලියන 11යි.

96/1/5, Suhada Mawatha, Sirimal Uyana,
Bandarawaththa, Gampaha.

07124153766
riviharapinne@gmail.com

CamScanner

**Rivihara Pinnaduwa**
*Attorney-at-Law*

වියදම බිලියන 40 ගාණක් වෙනවා. දුම්රිය දෙපාර්තමේන්තුවට ලාභ ලබන්න පුළුවන්. පාසල් දරුවන්ට දෙන සීසන් ටික කැන්සල් කරලා, රජයේ සේවකයන්ට දෙන සීසන් ටික කැනසල් කරලා, දුම්රිය ටිකට් එකේ ගාස්තුව බස් ටිකට් එකේ ගාණට ගේන්න ඕනෑ.

මෙහෙම කරන විට දුම්රිය දෙපාර්තමේන්තුවට ලාභ ලබන්න පුළුවන්. ලංගමයත් ලාභ ලබන තැනට ගෙන්න පුළුවන්. පාසල් දරුවන්ට දීලා තිබෙන සීසන් ටික, රජයේ සේවකයන්ට දීලා තිබෙන සීසන් කැන්සල් කරන්න ඕනෑ.

දුම්රිය ස්ට්‍රයික් එකක් ආව දවසට සීසන් එකෙන් යන මිනිහා කියනවා මේක පෞද්ගලීකරණය කරන්න ඕනෑ කියලා. දුම්රිය ස්ට්‍රයික් කරන හැටිත් එච්චර හොඳ නැහැ. ඒක වෙනම කතාවක්. නමුත් සීසන් එකෙන් දුම්රියේ යන ගමන් කියනවා මේක පෞද්ගලීකරණය කරන්න ඕනෑ කියලා යැයිද වැඩිදුරටත් හෙතෙම කිවේය."

එම ප්‍රවෘත්තියම අන්තර්ජාලයේ 'දිනමිණ' වෙබ් අඩවියෙහි (https://www.dinamina.lk/2024/01/31/local/60145/)ද පළ කරන ලදී.

එම ප්‍රවෘත්තිය අසත්‍ය ප්‍රවෘත්තියක් බව පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මාධ්‍ය ඒකකයේ සාමාජික චන්දන සිරිමල්වත්ත මහතා විසින් 2024 ජනවාර් 31 වැනි දින දරණ ලිපියක් මගින් ඔබ ආයතනය විසින් පළ කරනු ලබන දිනමිණ පුවත්පතේ ප්‍රවෘත්ති කර්තෘ වෙත දන්වමින් ඒ පිළිබඳව නිවැරදි කිරීමක් සිදු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

එසේ වුවද ඔබ ආයතනයේ දිනමිණ පුවත්පත එකී ප්‍රවෘත්තිය නිවැරදි කිරීම වෙනුවට සිදු කරනු ලැබුවේ 2024 පෙබරවාරි 1 වැනි දින දිනමිණ පුවත්පතේ මුල්පිටුවේ සහ 6වැනි පිටුවේ පහත සඳහන් ප්‍රකාශය පළ කිරීමයි.

"දුමින්ද නාගමුවගේ ප්‍රකාශය පෙරටුගාමීන් නෑ කියයි. - ඇත්ත මෙන්න

පක්ෂයේ ප්‍රචාරක ලේකම්වරයා කෑගල්ල දේවාලෙගමදී පැවති රැස්වීමකදී කරන ලද ප්‍රකාශයක් අප එම ප්‍රවෘත්තිය සකස් කිරීමට පදනම් කරගනු ලැබූ අතර, එම ප්‍රකාශය මෙම කිව්ආර් කේතය මගින් නැරඹිය හැකිය.

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ප්‍රචාරක ලේකම් දුමින්ද නාගමුව මහතා විසින් කළ ප්‍රකාශයක් පදනම් කරගෙන "සීසන් අවලංගු කළොත් දුම්රියට – ලංගමට ලාභ ලැබිය හැකියි" යන සිරස්තලයෙන් ඊයේ (31) අප පුවත්පතේ මුල් පිටුවේ පළ වූ ප්‍රවෘත්තිය සාවද්‍ය බව එම පක්ෂයේ මාධ්‍ය ඒකකය පවසයි.

එම පක්ෂයේ මාධ්‍ය ඒකකයේ චන්දන සිරිමල්වත්ත මහතාගේ අත්සනින් යුතුව ලිපියක් මඟින් අප වෙත ඒ බව දන්වා ඇත්තේ දුමින්ද නාගමුව සහෝදරයා කිසිදු අවස්ථාවක එවැනි ප්‍රකාශයක් සිදු කර නැති බව අවධාරණය කරමිනි. එම ප්‍රකාශය පක්ෂයේ මතය නොවන බවත් එහි දක්වා ඇත.

එම ප්‍රවෘත්තිය සම්පූර්ණ අසත්‍ය බවද එහි දක්වා ඇති අතර එම පුවත සම්බන්ධයෙන් කනගාටුව පළ කිරීමක් කරන ලෙස ද ඉල්ලා ඇත්තේ අදාළ ප්‍රවෘත්තිය පළ කිරීම සම්බන්ධයෙන් මූලාශ්‍රයක් පවා නැති බව සඳහන් කරමිනි.

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මාධ්‍ය ඒකකය මෙම නිවේදනය නිකුත් කර ඇත්තේ සිය පක්ෂයේ ප්‍රචාරක ලේකම් දුමින්ද නාගමුව විසින් මෙවැනි ප්‍රකාශයක් සිදුකළේ දැයි නිශ්චිත සොයා බැලීමකින් පසුවදැයි ඇත්තේ ගැටලුවකි.

96/1/5, Suhada Mawatha, Sirimal Uyana,
Bandarawaththa, Gampaha.

07124153766
riviharapinne@gmail.com

CamScanner

# Rivihara Pinnaduwa
*Attorney-at-Law*


දුමින්ද නාගමුව මහතා කෑගල්ල දේවාලේගමදී පසුගිය 29 වැනිදා මෙම ප්‍රකාශය සිදු කළ බව වගකීමකින් ප්‍රකාශ කරන අතර එම ප්‍රකාශය මේ සමඟ ඇති කිව් ආර්. කේතය මඟින් පාඨකයන්ට නැරඹීමට හැකියාව ඇත."

එම ප්‍රවෘත්තියම අන්තර්ජාලයේ 'දිනමිණ' වෙබ් අඩවියෙහි (https://www.dinamina.lk/2024/02/01/local/60433/)ද පළ කරන ලදී.

මාගේ සේවාදායකගේ උපදෙස් මත ඔබ වෙත දන්වා සිටින්නේ ඔබගේ පුවත්පතේ පළ කරනු ලැබූ ඉහත සඳහන් ප්‍රකාශයන් සාවද්‍ය බවද ඒවා මාගේ සේවාදායක විසින් සත්‍ය වශයෙන් සිදුකරනු ලැබූ ප්‍රකාශයක් විකෘති කොට මාගේ සේවාදායක විසින් සිදු කරනු ලැබූ ප්‍රකාශයේ අර්ථයට සම්පූර්ණයෙන්ම විරුද්ධ අර්ථයක් හඟවමින් සකස් කරනු ලැබූ ප්‍රවෘත්තීන් බවයි. මාගේ සේවාදායක විසින් ඔබ ආයතනය විසින් ප්‍රසිද්ධ කරන දිනමිණ පුවත්පත පළ කළ ප්‍රවෘත්තියේ සඳහන් කරනු ලැබූ අවස්ථාවේදී එනම්, 2024 ජනවාරි 29 දින කෑගල්ල දිස්ත්‍රික්කයේ දේවාලේගම ජනහමුවේදී සත්‍ය වශයෙන් සිදුකරනු ලැබූ ප්‍රකාශය පහත දක්වා සිටිමි.

"අද සමහරු කියනවා මේවා ඔක්කොම විකුණන්ට ඕන. විකිණුවට කමක් නෑ කියලා. දුම්රිය දෙපාර්තමේන්තුව පාඩු ලබනවා. බිලියන 11යි ආදායම. බිලියන හතළිස් ගානක් වියදම. දුම්රිය දෙපාර්තමේන්තුව ලාභ ලබවන්නට පුළුවන්. කොහොමද ලාභ ලබන්නෙ? දුම්රිය දෙපාර්තමේන්තුවෙන් දීලා තියෙන සීසන් එක කැන්සල් කරා නං පාසල් දරුවන්ට දෙන සීසන් එක කැන්සල් කරලා රජයේ සේවකයන්ට දෙන සීසන් එක කැන්සල් කරලා, තවත් දීලා තියෙන සීසන් කැන්සල් කරලා, දුම්රිය ටිකට් එකේ ගාස්තුව ගෙනාව නං බස් ටිකට් එකේ ගාස්තුව ගානට, දුම්රිය දෙපාර්තමේන්තුව මෙහෙම මෙහෙම කරන කොට ලාභ ලබනවා. දැන් ඒකට ඔයගොල්ලො කැමතිද? අපි අහන්නෙ. ඕකට කැමතිද? ඒක කැන්සල් කළොත් එහෙම කාගෙ සාක්කුවටද බලපාන්නෙ? දැන් වටෙන් කැරකිලා ඔක්කොම වැදිලා තියෙන්නෙ ඔයගොල්ලන්ට අපි අහනවා දරුවා යන්න පාවිච්චි කරන සීසන් එකත් නැති වුණොත් එහෙම වාර ප්‍රවේශ පත්‍රයත් නැති වුණොත් එහෙම ඒක කාටද බලපාන්නෙ?

ලංගමය ලාභ කරවන්න පුළුවන්. ලංගමය ලාභ කරවන්න ඔය ළමයින්ට දීලා තියෙන සීසන් ටික ඔක්කොම කැන්සල් කරලා, රජයේ සේවකයන්ට දීල තියෙන සීසන් කැන්සල් කරා නං ලංගමය ලාභ ලබන්න පටන් ගන්නවා. ඒතකොට ඒකට මොකද කියන්නෙ ඔයගොල්ලො? මොකද මේ කවුරුත් නොදැන මේවා කියලා දීපු අය මේවා ඔක්කොම සමහරු අපේ කෝච්චියේ යන ගමන් කෝච්චි ස්ට්‍රයික් එකක් ආව දවසට කෝච්චියේ සීසන් එකෙන් යන මිනිහා කියනවා, "මේක ප්‍රයිවටයිස් කරන්න ඕන" කියලා. හරිද, කෝච්චි ස්ට්‍රයික් කැඳවන විදියත් එච්චර හොඳ නෑ. ඒකත් වෙනම කතාවක්. ඒකත් වෙනම ප්‍රශ්නයක්. නමුත් කෝච්චියේ සීසන් එකෙන් යන ගමන් කියනවා "මේවා විකුණන්න ඕන" කියලා. හරිද? මේවා විකිණුවොත් එහෙම සහෝදරයා මේ අපිට දැන් මේ වැදිලා තියෙනවට වඩා ඩබල් ට්‍රිබල් වදිනවා. මේගොල්ලො එතෙන්ට තමා මේක ගේන්න හදන්නෙ. මේගොල්ලො සෞඛ්‍ය සේවයට කරන්න හදන්නෙ ඒක. මේ ගොල්ලො අධ්‍යාපනයට කරන්න හදන්නෙ එ්ක. මේ රටේ පාසල් පද්ධතියට කරන්න හදන්නෙ ඒක. විශ්ව විද්‍යාල පද්ධතියට කරන්න හදන්නෙ ඒක. මේවා නිකං ස්වභාවික මරණයකට අත්හැරලා තියෙනවා. "

එසේ හෙයින් මාගේ සේවාදායකගේ උපදෙස් මත ප්‍රකාශකර සිටින්නේ ඔබ විසින් ඉහත සඳහන් පරිදි ඔහුගේ ප්‍රකාශය විකෘතිකර පළ කරන ලද්දේ මාගේ සේවාදායක කෙරෙහි පොදු මහජනතාව අතර අප්‍රසාදයක් සහ ද්වේශයක් ඇතිකර ලීමේ අරමුණෙන් යුතුව බවද ඔබ විසින් නිවැරදි කිරීමක් සිදුකරනු නොලැබුවේත් එම හේතුවෙන් බවත්ය. ඒ අනුව, ඔබගේ ඉහත සඳහන් ක්‍රියාවන් මාගේ සේවාදායකගේ කීර්තියට හානි කිරීමේ හා ඔහු අපහාසයට ලක් කිරීමේ ද්වේශ සහගත චේතනාවෙන් යුතුව බවත්ය.


96/1/5, Suhada Mawatha, Sirimal Uyana,
Bandarawaththa, Gampaha.

07124153766
riviharapinne@gmail.com


CamScanner

# Rivihara Pinnaduwa

*Attorney-at-Law*

ඔබගේ එකී ක්‍රියාවන් හේතු කොට ගෙන දේශපාලන ක්‍රියාධරයකු වශයෙන් මාගේ සේවාදායකගේ කීර්තියට සහ ඔහුගේ මතු බලාපොරොත්තුවලට බරපතළ හානියක් සහ පාඩුවක් සිදුකර ඇති බවත් එකී හානිය මාගේ සේවාදායක විසින් රුපියල් මිලියන පන්සියක්(රු.500,000,000.00) ලෙස තක්සේරු කර සිටින බවත්ය.

ඉහත සඳහන් රුපියල් මිලියන පන්සියක (රු.500,000,000.00), මුදල මෙම ලිපියේ දින පටන් දින 14ක් ඇතුළත මාගේ සේවාදායක වෙත ගෙවන ලෙස මා හට ලැබුණු උපදෙස් මත දන්වා සිටිමි. තවද එලෙස එකී මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් සහ/හෝ පැහැර හැරියොත් එකී මුදල සහ නඩු ගාස්තුද වෙනත් සහනයන්ද ලබා ගැනීම සඳහා ඔබට සහ දිනමිණ පුවත්පතේ ප්‍රධාන කර්තෘට විරුද්ධව නඩු පැවරීමටද මා හට උපදෙස් ලැබී ඇත.

මෙයට

නීතිඥ

රිවිහාර පින්නදූව

Rivihara Sachith Pinnaduwa
LL.B., BA
Attorney - at - Law, Commissioner for Oaths
No: 96/1/5, Suhadha Mawatha,
Sirimal Uyana, Gampaha.

96/1/5, Suhada Mawatha, Sirimal Uyana,
Bandarawaththa, Gampaha.

07124153766
rivharapinne@gmail.com

CamScanner